1[st] Place Winner
National Productivity
Award 2020

SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

SLSI SYSTEM ISO 9001 CERTIFIED

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/13/CIR.COM.(3) | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2026.03. 10 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/SP/1/1/01 හා 2026.03.09 දිනැති ලිපිය හා බැඳේ.

02. එමඟින්, පහත සටහනේ දක්වා ඇති චක්‍රලේඛය, 2026.03.01 දින සිට දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2026.03.06 දාතමින් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලැබී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

| අනු අංකය | චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/2026 | 2026.02.27 | ආයතන සංග්‍රහයේ XX1V වැනි පරිච්ඡේදයේ 11 වගන්තිය සංශෝධනය කිරීම රාජ්‍ය නිලධරයන්ට සහන පොළී යටතේ නිවාස හා දේපළ ණය ලබාදීම |

03. ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ යටතේ පවතින අදාළ ආයතන දැනුවත් කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

රනිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
ஆளுநர் செயலகம் - தென் மாகாணம்
Governor's Secretariat - Southern Province

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number: GS/SP/ 1/1/01 | ඔබේ අංකය / உமது இல. / Your Number: | දිනය / திகதி / Date: 2026.03. 09 |

10 MAR 2026
ප්‍රධාන ලේකම් දකුණු පළාත.
DF

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**<u>පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව චක්‍රලේඛ දකුණු පළාත් සභාව සඳහා අදාළ කර ගැනීම.</u>**

ශීර්ෂගත කරුණ සම්බන්ධව, ඔබගේ අංක: CSS/7/03/13/CIR.COM(3) හා 2026.03.03 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව,පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 11 වගන්තිය සංශෝධනය කිරීම යටතේ රාජ්‍ය නිලධාරීන්ට සහන පොළී යටතේ නිවාස හා දේපළ ණය ලබා දීම සම්බන්ධයෙන් 2026.02.27 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **08/2026** හි ඇතුලත් විධිවිධාන සමගින්, **2026.03.01** දින සිට දකුණු පළාත් සභාව සඳහා අදාළ කර ගැනීමට 2026.03.06 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා එවමි.

03. ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද ඉහත සඳහන් චක්‍රලේඛ පිටපතක් මේ සමග අමුණා ඔබ වෙත කාරුණිකව යොමු කරමි.

කේ.පී.එස්. දමයන්ති
පරිපාලන නිලධාරී,
ආණ්ඩුකාර ලේකම් වෙනුවට,
දකුණු පළාත.

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල. | முகவரி: கீழ் டிக்சன் வீதி, காலி. | Address: Lower Dikson Road,Galle.
දුරකතන/ෆැක්ස්: 091-2234480 | தொலைபேசி/தொலைநகல்: 091-2234480 | Telephone/Fax: (+94)91-2234480
ඊ-මේල්: governsecspc@sltnet.lk | மின்-அஞ்சல்: governsecspc@sltnet.lk | e-mail: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk | இணையதளம்: governor.sp.gov.lk | e-mail: governor.sp.gov.lk

133.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 08/2026

මගේ අංකය : EST-6/04/LON/1040 (ii)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2026.02.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 11 වගන්තිය සංශෝධනය කිරීම රාජ්‍ය නිලධරයන්ට සහන පොලී යටතේ නිවාස හා දේපළ ණය ලබාදීම

2007.06.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2007 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 11:4:1, 11:5:1 උප වගන්ති සහ 28 පරිශිෂ්ටය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. ආයතන සංග්‍රහයෙහි XXIV වැනි පරිච්ඡේදයේ 11:4:1 උප වගන්තිය සහ 11:5:1 උප වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

11:4:1 නිලධරයාට හිමිකම් ලබාගත හැකි උපරිම ණය මුදල නිලධරයාගේ දීමනා හැර වසර 07ක ඒකාබද්ධ වැටුප හෝ රුපියල් ලක්ෂ 50ක මුදල යන දෙකෙන් අඩු මුදල.

11:5:1 ඉහත 11:4:1 උප වගන්තිය යටතේ ලබාගන්නා ණය මුදල් වෙනුවෙන් බැංකු විසින් නිවාස හා දේපළ ණය සඳහා අයකරනු ලබන උපරිම පොලී ප්‍රතිශතය එක් එක් වර්ෂය සඳහා ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ප්‍රකාශිත සාමාන්‍ය බරිත ප්‍රමුඛ ණය පොලී අනුපාතය (Average Weighted Prime Lending Rate - AWPLR) + 2%ක් පමණ වූ උපරිම පරිපාලන ගාස්තුවකට යටත්ව ගණනය කරනු ලබන අතර, එම පොලී ප්‍රතිශතය අදාළ ණය මුදල ගෙවා අවසන් වනතුරු නොවෙනස්ව බලපැවැත්වේ.

ඒ අනුව, ලබාගන්නා ලද ණය මුදල සඳහා පහත වගුවේ සඳහන් පරිදි වාර්ෂික පොලියක් අයකරනු ලැබේ.

| ණය මුදල | බැංකුවට ගෙවිය යුතු පොලී ප්‍රතිශතය | රජය විසින් ගෙවිය යුතු පොලී ප්‍රතිශතය | නිලධරයා විසින් ගෙවිය යුතු පොලී ප්‍රතිශතය (දේපළ ණය ඉල්ලුම් කරන වර්ෂයට අදාළව) |
|---|---|---|---|
| රු. 3,000,000/- දක්වා | AWPLR + 2% | 4% | (AWPLR + 2%) - 4% |
| රු. 3,000,000/- ඉක්මවා රු. 5,000,000/- දක්වා | AWPLR + 2% | 2% | (AWPLR + 2%) - 2% |

මෙම රාජ්‍ය පරිපාලන
.....08/2026.....චක්‍රලේඛය/
.....2026/03/01.....දින සිට දකුණු
පළාත් සභාවට අදාල කර ගැනීම
සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ
අනුමැතිය .....2026/03/06.....දින ලබා දී ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාර ලේකම්/සහකාර ලේකම්/

03. ඉහත 02වන ඡේදය යටතේ සංශෝධිත පොලී අනුපාත මෙම චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක වන 2026.03.01 දින හෝ එදිනට පසුව ලබාදෙනු ලබන නිවාස හා දේපළ ණය සඳහා පමණක් අදාළ වන අතර, 2026.03.01 දිනට පෙර 2007.06.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2007 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන යටතේ රජයේ නිලධරයන් විසින් දැනටමත් ලබාගෙන ඇති නිවාස හා දේපළ ණය සම්බන්ධයෙන් මෙම විධිවිධාන අදාළ නොවේ.

04. තවද, ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 11:11:6 සහ 11:11:7 උප වගන්තීන්හි ඇතුළත් නිවාස හා දේපළ ණය ලබාගත හැකි බැංකු නාම ලේඛනය ඇතුළත් 28 පරිශිෂ්ටය (ඇමුණුම 01) පරිදි සංශෝධනය විය යුතු ය.

05. රජයේ නිලධරයන් සඳහා බැංකු මඟින් නිවාස හා දේපළ ණය ලබාදීම සම්බන්ධයෙන් වන අනෙකුත් සියලුම විධිවිධාන නොවෙනස්ව පවතී.

06. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

මෙම රාජ්‍ය පරිපාලන
~~රාජ්‍ය~~ 04/2026 චක්‍රලේඛය;
~~උපලේඛන~~ 2026/03/01 දින සිට දකුණු
පළාත්සභාවට අදාල කර ගැනීම
සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ
අනුමැතිය 2026/03/06 දින ලබා දී ඇති බව
සහතික කරමි.

(signature)

ආණ්ඩුකාර ලේකම්/සහකාර ලේකම්/ස.නි.

(signature)
එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය


දුරකථන : 011-2699399
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ad-6-est@pubad.gov.lk

[redacted] 132

ඇමුණුම 01

<u>28 වැනි පරිශිෂ්ටය</u>
(XXIV -11:11:6, 11:11:7)

**ණය ලබා ගත හැකි බැංකු නාම ලේඛනය**

1. මහජන බැංකුව
2. ලංකා බැංකුව
3. ජාතික ඉතිරි කිරීමේ බැංකුව

මෙම රාජ්‍ය පරිපාලන
චක්‍රලේඛ ...08/2026...චක්‍රලේඛය/
උපලේඛන ලිපිය ...2026/03/01...දින සිට දකුණු
පළාත් සභාවට අදාල කර ගැනීම
සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ
අනුමැතිය...2026/03/06...දින ලබා දී ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාර ලේකම්/සහකාර ලේකම්/කාර්‍ය ශ්‍රී.